# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2000/6 – 2017 ජනවාරි 02 වැනි සඳුදා – 2017.01.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම මාතර - කතරගම නව දුම්රිය මාර්ගය ඉදිකිරීම නිසා නිවාස අවධානම් තත්වයට පත්වීම සහ එම ස්ථානයේ පවතින තාක්ෂණික අවශ්‍යතාවය මත නිවාස අත්කර ගැනීම සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතර කඩවත් සතර සුළු කොට්ඨාසයේ, තල්පාවිල උතුර ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක එම්ආර්/එම්ටීආර්/2015/535 හා 2016.03.16 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – හිල්ක්‍රෙස්ට්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0555

උතුරට: මාර්ගය සහ එම්. බී. සිරිමාවතී හිමිකම් කියන හිල්ක්‍රෙස්ට්වත්ත; නැගෙනහිරට: කේ. කේ. රංජිත්ලාල් හිමිකම් කියන සිල්වර්ඩේල්වත්ත සහ මාතර - කතරගම යෝජිත දුම්රිය මාර්ගය සඳහා අත්කර ගෙන ඇති ඉඩම; දකුණට: මාතර - කතරගම යෝජිත දුම්රිය මාර්ගය සඳහා අත්කර ගෙන ඇති ඉඩම; බටහිරට: නන්දවතී මහමුල්ලගේ හිමිකම් කියන හිල්ක්‍රෙස්ට්වත්ත සහ හිමිකරු සොයාගත නොහැකි හිල්ක්‍රෙස්ට්වත්ත.

ජෝන්. ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/11/2015/එන්ආර්ඞී/217.
2016 ඔක්තෝබර් මස 27 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01 - 455



*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*